# බුද්ධිමතුන් රහිත ශ්‍රී ලංකාවක්




දිවියේ සැඳෑ සමය අප අතර මෙල්බර්න් හි ගත කළ එච් පී සිරිවර්ධන උපහාසයෙන් පිරි කෙටිකතා ලිවීමෙහිද රුසියෙක් විය. "දේශපාලකයන් නැති ලෝකය" නම් වූ කෙටි කතා එකතුනේ එනමින් එන කතාව එයට හොඳම නිදසුන ය.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සහ උත්තර මන්ත්‍රී මණ්ඩලයේ නිලධාරියකු වශයෙන් දිගු කලක් සේවය කිරීමේදී ඇසුරු කළ දේශපාලකයන් ගේ ගති පැවතුම් නිරීක්ෂණයෙන් බිහි වූ නිමැවුමක් ලෙසින් ය මා ඒ කෙටි කතාව දකින්නේ.

සිරිවර්ධන අද ජීවත්ව සිටියා නම්?

එකත් එකට ඔහු "බුද්ධිමතුන්ගෙන් තොර වූ ශ්‍රී ලංකාව" නමින් අගේ ඇති කෙටිකතාවක් නිර්මානය කරනු ඇත .

රට එපා වෙලා පලච්ච එකකු දැන් මේ රටේ බුද්ධිමතුන් ගරහනවා යයි චෝදනාවක් මට මේ බිමෙන් එල්ල වන්නට හොඳටම ඉඩ ඇත .

ඒ දෙකම වැරදි මත බව මුලටම කිව යුතුය. මා වාගේම මෙහේ එන හා ආ බොහෝ දෙනා එන්නේ මව් බිම එපා වූ නිසා නොවේ. අපි බොහෝ දෙනෙක් එක්තරා නිශ්චිත අරමුණක් සහිතව මේ රටට සංක්‍රමණය වූයෙමු. ඒ අපේ දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබා දී ඔවුන්ගේ අනාගතය සමෘධිමත් වනු දකින්නටය.

ඒ අතින් අපට සතුටු විය හැකි වැදගත් කරුණක්ද ඇත. අපේ දරුවෝ අනෙක් ජනවාර්ගික කොට්ඨාශ වල දරුවන් සමග හරි හරියට බොහෝ විට ඔවුන් අබිබවා දස්කම් පෑමට සමත් වන බව අපි දනිමු. මෙහි එන්නට අවසරපත් නොලබා මව් බිමේදීම දිගටම ඉගෙන ගන්නා දරු දැරියෝද ඒ වාගේම දක්ෂ හා බුද්ධිමත් පිරිසක් බව ද අපි විශ්වාස කරමු. මෙහි හැදෙනා අපේ දරුවන් ලබන විදියේ දියුණුවක් අනාගතයේ ශ්‍රී ලංකාවේ සිටින හැම දරුවකුම ලබනවා දැකීම අපට අව්‍යාජ තෘප්තියක් හා ප්‍රමෝදයක් ගෙනෙන බවද කිව යුතු ය.

ශ්‍රී ලංකාවේ ගුරු පරපුර ගැන සිතන විට අපට ප්‍රීතියෙන් පිනා යන්නට බැරි ය. මෙහි උගන්නා අපේ දරුවන් කිසිදු සම්බාධකයක් රහිතව උසස් අධ්‍යාපනය හමාර කරද්දී ඔවුන් සමග එකට පාසල් ගිය ශ්‍රී ලාංකික දරුවෝ සරසවියෙන් පිටත ළතැවෙවී සිටිති. නවසිය පනස්දෙක පනස් තුන වසරවල පේරාදෙණියේ පැවති සිසු අරගල සමහරක් මට මතක් වෙයි. ශිෂ්‍ය නිවාසයක ගැටලුවක් නිසා කිපුණු ශිෂ්‍ය පිරිසක් ආචාර්ය කට්බර්ට් අමරසිංහගේ නිල නිවස ඉදිරිපිට විරෝධතා රැළියක් පවත්වා සාමකාමීව විසිරී ගියහ. කිසිවකුට අනතුරක් නැත.

පසු දින උපකුලපති නිවස වටා තණබිමේ වාඩි වී උපකුලපති එන තෙක් බලා සිටි ශිෂ්‍ය ශිෂ්‍යාවන් සමග



ඉතා සුහදව සාකච්ඡා කොට තීරණයක් ගැනීමට සර් අයිවර් ජෙනිංන්ස් සමත් විය. ශිෂ්‍යයෝ පොලිසිය සමග පවා ගැටුණෝය. ඒ සියල්ල එතැනින් හමාරය. සරසවි අධ්‍යාපනය අඩාල වූයේ නැත .

අද තත්වය සපුරා වෙනස් ය. අද වාතාවරණය සහ ගැටලු ද වඩා සංකීර්ණ බව අපි පිළිගනිමු. ඒ අතරම මා දකින විශේෂයක් වනුයේ අද ශිෂ්‍යයා අපේ යුගයේ ශිෂ්‍යයාට වඩා බුද්ධිමත් කෙනකු වීමය. ප්‍රශ්න සමගම බුද්ධි වර්ධනයද සිදු වී ඇති පාට ය.

සරසවි ගැටලුව ශිෂ්‍යයන් පිළිබඳ වූවක් පමණක්ම නොවේ. සරසවි ඇදුරෝද අවි අමෝරා ගෙන සටනට ඉදිරිපත්ව සිටිති. රටක අනාගතය බාර ගන්නා තරුණ පරපුර සමග ඔවුන්ට මං පෙන්වීමට සිටින බුද්ධිමතුන් ද පවත්නා තත්වයට එරෙහිව නැගී සිටිනවා කියන්නේ රටේම අනාගතය පිළිබඳ අවිනිශ්චිත තත්වයක් උදා වී තිබීම ය.

තිස් වසරක් පුරා ඇදී ගිය මහා ජාතික ව්‍යසනයක් හමාර කරන්නට සමත් වූ ජනාධිපතිවරයකු යටතේ අද දින සිදු විය යුත්තේ ත්‍රස්තවාදීන්ගෙන් ගලවා ගත් දේශයේ අනාගත ශුභ සිද්ධිය පිණිස ඉදිරියට එන පරපුර අධ්‍යාපනය අතින් හා වෙනත් හැකියාවලින් පොහොසත් කොට රැක බලා ගැනීම ය.

රටේ අනාගත නායකයන් බවට පත්වන බුද්ධිමතුන් හැඩගැස්වීමේ බරපතල වගකීම දරනා සරසවි ඇදුරෝ සමස්ත ජාතියේම අනාගතය හසුරුවන්නෝ වෙති. ඔවුන්ගේ වගකීම ඉටු කළ හැකි විදියේ චිත්ත විවේකයක් හා සාමකාමී වාතාවරණයක් ඔවුන්ට සලසා දිය යුතු ය. ඒ සියල්ලටම කලින් ඔවුන් ගෞරවාන්විත ආකාරයට පිළිගත යුතු ය. ඔවුන්ගේ අදහස් උදහස් ඉවසිල්ලේ සවන් දී වටහා ගත යුතු ය. ඔවුන් කිසි විටෙක දේශපාලකයන් ගේ ගර්හාවට හෝ අතවර වලට ලක් වීමට ඉඩ නොතැබිය යුතු ය.

කොටින්ම එබඳු විද්වතුන් තමන්ගේද ගුරුවරුන් වශයෙන් සැලකීමට තරම් දේශපාලකයන් නිහතමානී විය යුතු ය. එය අමුතුවෙන් කිව යුතු දෙයක්ද නොවේ. අපේ පාසලේ ගුරුවරයාට පවා අපේ දෙමව්පියෝ සැලකූ ආකාරය අපට මතකය. ඒ අප සතු සංස්කෘතියේ සුවිශේෂි ලක්ෂණයකි. එය අද අතුරුදන් වීලා ද?

මෙබඳු ජාතික අර්බුද පැන නැගුණු විට සමස්ත ජනතාවම අවදියෙන් සිටිය යුතුය. ගිහි පැවිදි දෙපක්ෂයේම විද්‍යාඥයෝ විද්වත්තු සහ ජනමතය කෙරෙහි බලපෑමට සමත්වන්නෝ ප්‍රශ්නය කෙරෙහි සෘජුවම යොමු විය යුත්තෝ ය. එසේ වන්නේ නම් පවත්නා අඳුරු නොපැහැදිලි වාතාවාරණය ඉවත් කළ නොහැකි විදියේ බුද්ධිමත් සංවාදයක් පැවැත්වීමද පහසු වනු ඇත.

අද රටේ බුද්ධිමය සංවාදයක් කියා දෙයක් ඇති පාටක් නැත. එය රටේත් ජාතියේත් අභාග්‍යයකි. ජනාධිපතිතුමා වටා සිටින විද්වත් පිරිස පවා බුද්ධියට පිටුපා ගිය සැටියක් මා දුටුවේ අප රටේ මහා ප්‍රාඥයකු විද්‍යාඥයකු ද ව සිටි ආචාර්ය ආනන්ද කුමාරස්වාමි කොහේදෝ නැති පොකුණක ගිල්වා අමතක කළ දවසේ ය. ශ්‍රී ලංකා බුද්ධිමය සංවාදයකට මුල පුරන්නේ කවරෙක්ද

MASTER TUTORING ACADEMY
MTA
"Your success is our satisfaction"
**Master Tutoring Academy**

**මාස්ටර් ටියුටරින්**
**පැයකට ඩොලර් 10**
**බජට් පැකේජය සමග**
**Dandenong වලට**
**පිවිසෙන වගයි !!!**

සංවිධානය
**නිහාල් කොඩිකාර**

**වැඩි විස්තර**
**0425 403 105**
**0430 635 335**

**3 4 5 පන්ති සඳහා**

**MONT ALBERT DENTISTS P/L**
**For all Your Dental Requirements**

We Provide
**GENERAL DENTAL TREATMENT**
**COSMETIC DENTAL**
**TEETH WHITENING**
**PARTIAL/FULL DENTURES**
**EMERGENCY SERVICES**

WE ACCEPT COMMUNITY DENTAL VOUCHERS, TEEN VOUCHERS, ALL PRIVATE HEALTH INSURANCES AND MEDICARE VOUCHERS FOR APPROVED PATIENTS.

**FOR APPOINTMENTS**
**9890 3609**

**DISCOUNTS FOR FAMILIES, FREE CHECK UPS FOR KIDS UNDER 7 YEARS**

**DR. ENOKA JAYATILAKEBANDA (BDS)**

**MONT ALBERT DENTISTS**
2A CHURCHILL ST
MONT ALBERT VIC 3127
(CLOSE TO BOX HILL CENTRAL)